**30-12-2020** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබට සංගම යුගයෙදී සත්‍ය පියාගෙන් සත්‍යයේ ආශිර්වාදය ලැබෙයි. එබැවින් ඔබ කිසි විටෙක බොරු නොකිව යුතුයි.

**ප්‍රශ්නය:** දුර්ගුණ වලින් තොර වීම සඳහා ඔය දරුවන් අනිවාර්යෙන්ම සිදු කළ යුතු උත්සාහය කුමක්ද?

**පිළිතුර:** ඔබ අනිවාර්යෙන්ම ජීවාත්ම අවධානයට පත්වීමට උත්සාහ දැරිය යුතුයි. නළල මධ්‍යයේ ඇති ජීවාත්මය දෙස පමණක් බැලීමට පුහුණු වන්න. ඔබ ජීවාත්මයන්ට කතා කරන විට සහ ජීවාත්මයන්ට සවන් දෙන විට, තමන් ජීවාත්මයක් බව සලකන්න. ඔබගේ බැල්ම ඔවුන්ගේ සිරුරු මත නොවැටිය යුතුයි. ඔබ සිදු කළ යුතු ප්‍රධානතම උත්සාහය මෙය වන අතර, බාධක ඇති වන්නේ මෙම උත්සාහයේදීය. හැකිතාක් මෙය පුහුණු වන්න, 'මා ජීවාත්මයකි, මා ජීවාත්මයකි.'

**ගීතය:** ශිවාට නමස්කාර වේවා!

ඕම් ශාන්ති. ලෝක චක්‍රය බ්‍රමණය වන ආකාරය ගැන පරමාත්ම පියා ඔය සුමිහිරි දරුවන්ට මතක් කර දී තිබේ. ඔබට පියාගෙන් දැනගැනීමට ලැබුණු කුමක් වුවද, එමෙන්ම පියා ඔබට පෙන්වා දී ඇති මාර්ගය, ලෝකයේ වෙනත් කිසිවෙකු නොදන්නා බව, ඔය දරුවන් දැන් දන්නවා. තවද ඔහු මෙහි අරුත පැහැදිලි කර දී තිබෙනවා 'පිදුම් ලබන්නට සුදුසු, ලෝක අධිපතියන් වන අය, පසුව වඳින්නන් බවට පත්වෙයි.' ඔබ උත්තරීතර පරම පියා ගැන මෙසේ නොකියනු ඇත 'ඔබ පිදුම් ලබන්නට සුදුසු මෙන්ම, ඔබ වඳින්නෙක්.' මෙය සම්පූර්ණයෙන්ම නිවැරදි බව ඔබගේ බුද්ධියට ඇතුලු වී තිබේ. ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ පුවත් ඔබට පවසන්නේ පරමාත්ම පියා පමණයි. වෙනත් කිසිම කෙනෙකුට, ඥානයේ මහා සාගරය, යැයි කිව නොහැක. මෙය ශ්‍රී ක්‍රිෂ්ණාගේ ප්‍රශංසාව නොවෙයි. ක්‍රිෂ්ණා යනු එම ජීවාත්මයගේ සිරුරේ නමය. ඔහු ශාරීරික ජීවයකි ඔහුට මේ සියළු ඥානය තිබිය නොහැක. එම ජීවාත්මයට දැන් ඥානය ලැබෙන බව, ඔබට වැටහෙනවා. මෙය ආශ්චර්යමත් දෙයකි. පරම පියා හැර වෙනත් කිසිවෙකුට මෙය විස්තර කළ නොහැක. බොහෝ විවිධ අන්දමේ හත යෝගා උගන්වන බොහෝ සාදු සන්යාසීන් සිටියි. ඒ සියල්ලම භක්ති මාර්ගයයි. ඔබ ස්වර්ණමය යුගයෙදී කිසිම කෙනෙක් පුදන්නේ නැත. ඔබ එහිදී වඳින්නන් වන්නේ නැත. ඔවුන් පිළිබඳවයි මෙසේ පැවසෙන්නේ ඔවුන් පිදුම් ලබන්නට සුදුසු දේවතාවන්ව සිටියා කෙසේවෙතත්, ඔවුන් දැන් එසේ නැත. එම පිදුම් ලබන්නට සුදුසු අයම, දැන් වඳින්නන් බවට පත්ව ඇත. පරම පියා පවසන්නේ මෙම කෙනාද වැඳුම් පිදුම් සිදු කළා. මෙකල මුලු ලෝකයේ සියළුම මිනිසුන්, වඳින්නන්ය. නව ලෝකයේ, පිදුම් ලබන්නට සුදුසු, අයගේ එක් දේවතා ධර්මය පමණයි තිබෙන්නේ. නාටකයේ සැලසුමට අනුව, මෙය සම්පූර්ණයෙන්ම නිවැරදි බව, ඔය දරුවන් දැන් දන්නවා. මෙය සැබවින්ම ගීතාවේ කථාංගයයි. ඔවුන් කර තිබෙන්නේ, ගීතාවේ නම වෙනස් කිරීම පමණක් වන අතර, ඔබ මෙය විස්තර කිරීමට උත්සාහ දරයි. ගීතාව පැවසුවේ ක්‍රිෂ්ණා බව, ඔවුන් වසර 2500ක්ම සිතා සිටියේය. දැන් එක් උපතකදී, ගීතාව පැවසුවේ අශාරීරික දෙවියන් බව වටහා ගැනීමට, ඔවුන්ට කාලයක් ගත වෙයි, නේද? භක්තියේ වෘකෂය කෙතරම් උසද එමෙන්ම සංකීර්ණද කියාත් ඔහු විස්තර කර තිබේ. පරමාත්ම පියා ඔබට රාජයෝගාව උගන්වන බව, ඔබට ලිවිය හැක. එවන් විශ්වාසයක් තිබෙන දරුවන්, ඉන්පසුව එම විශ්වාසයෙන් වෙනත් අයටද විස්තර කරයි. එම විශ්වාසය නොමැති නම්, වෙනත් අයට විස්තර කරන්නේ කෙසේද කියා, ඔබ අවුලට පත් වන අතර, එමෙන්ම යම් කැලඹීමක් ඇති වෙයි කියා ඔබට බියක්ද ඇතිවෙයි. ඔබ තවමත් නිර්භය අය වී නැත. ඔබ සම්පූර්ණයෙන්ම ජීවාත්ම අවධානයට පත් වූ විට, ඔබ නිර්භය වෙයි. ඔවුන්ට බිය තිබෙන්නේ භක්ති මාර්ගයේය. ඔබ සියල්ලන්ම එඩිතර සටන්කාමීන්ය. ලෝකයේ කිසිම කෙනෙක් මායා පරාජය කරන අන්දම නොදනී. පරම පියා ඔබට පෙරද මෙසේ කියූ බව, ඔය දරුවන්ට දැන් මතක් වෙයි මන්මනභව! පැමිණ ඔබට මෙය විස්තර කරන්නේ, පාරිශුද්ධකරු පරමාත්ම පියා පමණයි. මෙම පදය ගීතාවේ සඳහන් කර ඇති නමුත්, කිසිම කෙනෙකුට එය ඔබට විස්තර කළ නොහැක. පරම පියා පවසන්නේ දරුවනි, ඔබ ජීවාත්ම අවධානයට පත්වේවා! ගීතාවේ මෙම වදන්, පිටි ගෝනියක ඇති ළුණු තුඩක් වැනිය. පරමාත්ම පියා, සෑම දෙයක් පිළිබඳවම, ඔබ තුළ විශ්වාසය ඇති කරවයි. විශ්වාසවන්ත බුද්ධි ඇති අය ජයගනී. ඔබ දැන් පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගන්නවා. පරම පියා පවසන්නේ ඔබ අනිවාර්යෙන්ම ඔබගේ පවුලේ අය සමග ඔබගේ

නිවසේ වාසය කළ යුතුයි. සෑම කෙනෙකුටම මෙහි පැමිණ වාසය කිරීමට අවශ්‍යතාවයක් නැහැ. සේවය කළ යුතු අතර මධ්‍යස්ථාන විවෘත විය යුතුයි. ගැලවීමේ හමුදාව ඔබයි. දේවමය දූත මෙහෙය ඔබයි. පෙරකල, ඔබ මායාගේ ශුද්‍ර දූත මෙහෙයට අයත් වූ අතර, ඔබ දැන්, අයත් වන්නේ දේවමය දූත මෙහෙයටයි. ඔබ බොහෝ වැදගතුන්ය. ලක්ෂ්මී සහ නාරායන්ගේ ප්‍රශංසාව කුමක්ද? ඔවුන්ද වෙනත් රජවරුන් පාලනය කරන එම අන්දමින්ම පාලනය කරන නමුත්, එකල වෙනත් කිසිම රාජධානියක් නොමැති බැවින් ඔවුන්ට 'සියළුම ගුණධර්ම වලින් සපිරි එමෙන්ම ලෝකයේ අධිපතියන්' යැයි කියයි. ඔවුන් ලෝකයේ අධිපතියන් වූයේ කෙසේද කියා, ඔය දරුවන්ට දැන් වැටහෙයි. අපි දැන් දේවතාවන් බවට පත් වෙමින් සිටිනවා. එබැවින් අපි ඔවුන් ඉදිරියේ හිස නමන්නේ කෙසේද? ඔබ දැන් ඥානයෙන් පිරිපුන් වී ඇත. ඥානය නොමැති අය, දිගින් දිගටම ඔවුන්ගේ හිස් නමයි. එමෙන්ම ඔබ දැන් සෑම කෙනෙකුගේම කාර්යභාරය ද දන්නවා. නිවැරදි වන්නේ කුමන පිංතූරද, වැරදි වන්නේ, කුමන ඒවාද කියා ඔබට දැන් විස්තර කළ හැක. තවද මෙය රාවන ගේ රාජධානිය බවත් එය ගිණිබත් වීමට ඉතාමත්ම ආසන්න බවත් ඔබට විස්තර කළ හැක. පිදුරු ගොඩ ගිණි ගත යුතුයි. ලෝකය, පිදුරු ගොඩක් මෙන් බව කියයි. භාවිත කර ඇති වචන, ඔබ පහදා දිය යුතුයි. ඔවුන් භක්ති මාර්ගයේ, බොහෝ පිංතූර නිර්මාණය කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මුලින්ම තිබෙන්නේ ශිව බාබාගේ වන්දනාව වන අතර, පසුව බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ව වන්දනා කරයි. ඔවුන් නිර්මාණය කර ඇති ත්‍රිමූර්තිය නිවැරදියි. ඉන්පසුව මෙම ලකෂ්මී සහ නාරායන සිටියි. ත්‍රිමූර්තියේ, බ්‍රහ්ම සමග සරස්වතීද ඇතුලත්ය. ඔවුන් භක්ති මාර්ගයේ බොහෝ පිංතූර නිර්මාණය කරති. ඔවුන් හනුමාන්ව පවා වන්දනා කරයි. ඔබ එඩිතර සටන්කාමීන් බවට පත්වනවා. දිල්වාලා දේවාලයේ, ඇතැම් අය ඇතුන් පිටත්, ඇතැමුන් අශ්වයන් පිටත් පෙන්වා ඇත. කෙසේවෙතත්, ඔවුන්ගෙන් කවුරු හෝ (දේවතාවන්) එසේ ඔවුන් පිට යන්නේ කෙසේද? පරමාත්ම පියා පවසන්නේ මහාරතීන්. මහාරති යනු, ඇතෙක් පිට යන කෙනෙක්. එබැවින් ඔවුන් පෙන්වා ඇත්තේ ඔවුන් ඇතෙක් පිට යන ලෙසයි. කිඹුලා, ඇතාව ගිල දැමූ ආකාරය ද ඔබට විස්තර කර ඇත. පරම පියා විස්තර කරන්නේ මායා යන කිඹුලා, ඇතැම් විට මහාරතීන්ව ගිල දමයි. ඔබට දැන් මෙම ඥානය වැටහෙනවා. මායා, හොඳ මහාරතීන්ව ගිල දමයි. මෙම දේවල් ඥානයේ කරුණුයි. කිසි කෙනෙකුට මෙම දේවල් පැහැදිලි කළ නොහැක. පියා පවසන්නේ දුර්ගුණ වලින් තොර වී දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. සෑම චත්‍රයකදීම පරම පියා පවසන්නේ විශාලතම සතුරා වන්නේ රාගයයි. එය පරාජය කිරීමට ඔබට උත්සාහයක් අවශ්‍යයි. ඔබ ප්‍රජාවගේ පියාට අයත්ය. එබැවින් ඔබ සහෝදර, සහෝදරියන්ය. ඇත්ත වශයෙන්ම ඔබ මුලින්ම, ජීවාත්මයි. ජීවාත්ම, ජීවාත්මයන්ට කතා කරනවා. මෙම දෙසවන් වලින් සෑම දෙයක්ම ඇසෙන්නේ ජීවයට බව, ඔබ මතක තබා ගත යුතුයි. මා කතා කරන්නේ ශරීරයකට නොවෙයි, ජීවාත්මයකටයි. ජීවාත්ම වන අප, මුලින්ම සහෝදරයන්ය. ඉන්පසුව අපි එකිනෙකාගේ සහෝදරයන් සහ සහෝදරියන් බවට පත්වනවා. ඔබ මෙය සහෝදරයන්ට කියා දිය යුතුයි. ඔබගේ බැල්ම යා යුත්තේ ජීවාත්මය වෙතටයි. මා කතා කරන්නේ මගේ සහෝදරයාටයි. සහෝදරයා, ඔබ අහගෙනද ඉන්නේ? ඔව්, ජීවාත්මය වන මා, අහගෙනයි ඉන්නේ. බිකනීර් වල දරුවෙක් සිටිනවා, ඔහු සෑම විටෙකම ලියන්නේ 'මෙම ජීවාත්මය' සහ 'අර ජීවාත්මය' කියාය. 'ජීවාත්මය වන මා, මෙම සිරුර තුළින් ලියනවා.' 'ජීවාත්මය වන මා, මෙසේ සිතනවා.' 'ජීවාත්මය වන මා, මෙය කරනවා.' ජීවාත්ම අවධානයට පත් වීමට උත්සාහයක් අවශ්‍යයි. ජීවාත්මය වන මා, 'නමස්කාර' කියනවා. බාබා, 'ආධ්‍යාත්මික දරුවනේ' කියා පවසන විට, ඔහු බලන්නේ නළල දෙසයි. සවන් දෙන්නේ ජීවාත්මයයි. මා කතා කරන්නේ මෙම ජීවාත්මයටයි. ඒ අන්දමින්ම ඔබගේ බැල්ම පතිත විය යුත්තේ, නළල මැද සිටින ජීවාත්මය මතයි. ඔබගේ බැල්ම, ශරීරය මත වැටෙන විට, බාධක පැමිණෙයි. ජීවාත්මයන්ට කතා කරන්න! ජීවාත්මය දෙස බලන්න! ශරීර අවධානය අත්හරින්න! පරමාත්ම පියා නළල මධ්‍යයේ අසුන් ගෙන සිටින බවත්, ඔබ 'නමස්කාර' කියන්නේ ඔහුට බවත්, මෙම ජීවාත්මයටද වැටහෙයි. ඔබ ජීවාත්මයක් බවත්, සවන් දෙන්නේ ජීවාත්මය බවත්, යන ඥානය, ඔබගේ බුද්ධියට තිබේ. ඔබට මෙම ඥානය පෙර තිබුණේ නැත. ඔබට එම සිරුර ලැබුණේ, ඔබගේ චරිත කොටස රඟපෑමටයි. සිරුරට නමක් ලබා දෙන්නේ මේ නිසාය. ආපසු නිවසට යෑම සඳහා, ඔබ ජීවාත්ම අවධානයට පත් විය යුත්තේ මෙකලයි. එම නම ඔබට දී ඇත්තේ, චරිත කොටසක් රඟපෑම සඳහාය. නම් නොමැතිව, කිසිම ක්‍රියාකාරකමක් සිදු විය නොහැක. එහිද ව්‍යාපාරික ක්‍රියාකාරකම් තිබෙයි, නමුත් ඔබ සතෝප්‍රධාන් වී සිටියි. එහි පාපකාරී ක්‍රියා නොමැත්තේ ඒ නිසාය ඔබ කිසිම පාපකාරී ක්‍රියාවක් සිදු නොකරයි. එහි මායාගේ රාජධානිය නොපවතී. පරම පියා පවසන්නේ ඔය ජීවාත්ම, දැන් ආපසු නිවසට යා යුතුයි. මෙය පරණ සිරුරකි. ඉන්පසුව ඔබ ස්වර්ණමය සහ රිදී යුග වලට යයි. එහිදි ඥානයට අවශ්‍යතාවයක් නැත. ඔබට මෙහිදී ඥානය ලබා දෙන්නේ මන්ද? ඔබ පහත් තත්ත්වයක සිටින නිසාය. ඔබ එහිදීද ක්‍රියා සිදුකරයි, නමුත් ඒවා අකර්ම

වෙයි. පරමාත්ම පියා පවසන්නේ ඔබගේ දෑතින් වැඩ කරන්න, එමෙන්ම ඔබගේ හදවත පරම පියා සමග තබාගන්න! ජීවාත්මය, පරමාත්ම පියාව සිහිපත් කරයි. ස්වර්ණමය යුගයෙදි ඔබ පාරිශුද්ධයි, එබැවින් සියළුම ක්‍රියාවන් සත්‍යයි. රාවනගේ තමෝප්‍රධාන් රාජධානියේ සියළුම ක්‍රියා මුසාවකි. මිනිසුන් වන්දනා ගමන් ආදිය යන්නේ මේ නිසාය. ස්වර්ණමය යුගයේ, කිසිම කෙනෙක් පාපයක් සිදුකරන්නේ නැත, එමනිසා, ඔවුන්ට වන්දනා ගමන් යැමට අවශ්‍ය වන්නේ නැත. ඔබ එහි කුමක් කළත් එය සත්‍යයි. ඔබට සත්‍යයේ ආශිර්වාදය ලැබී තිබේ. එහි කිසිම පාපයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. කිසිම ක්‍රියාවකදී බොරුවක් කිරීමට අවශ්‍ය වන්නේ නැත. මෙහි, තන්හාව නිසා, ඔවුන් දිගින් දිගටම රැවටීලි, සොරකම් කිරීම් ආදිය සිදු කරයි. මෙම දේවල් එහි නොපවතී. නාටකයට අනුව ඔබ එවන් මල් බවට පත්වෙයි. එම ලෝකය අවගුණ වලින් තොර වන අතර මෙම ලෝකය දූෂිතය. මුලු නාටකයම ඔබගේ බුද්ධිය තුළ තිබේ. ඔබ පිවිතුරු වීමට උත්සාහ දැරිය යුත්තේ මෙකල පමණයි. යෝගා බලය තුළින්, ඔබ ලෝකයේ අධිපතියන් වෙයි. ප්‍රධානතම දෙය වන්නේ යෝගා බලයයි. පරමාත්ම පියා පවසන්නේ තපස් රැකීමෙන් හෝ යාග හෝම ආදිය පැවැත්වීමෙන් භක්ති මාර්ගයේ කිසිවෙකුට මා ලබා ගැනීමට නොහැකි වී තිබේ. සෑම කෙනෙක්ම සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව හරහා යා යුතුයි. මෙම ඥානය ඉතාමත්ම පහසු මෙන්ම විනෝදජනකය. එයට උත්සාහය ද අවශ්‍යයි. එය තුළින් ඔබ සතෝප්‍රධාන් වන, මෙම යෝගාවයි, ප්‍රශංසා කෙරෙන්නේ. තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වීමට ඔබට මාර්ගය පෙන්වන්නේ පරමාත්ම පියා පමණයි. වෙනත් කිසිම කෙනෙකුට මෙම ඥානය ඔබට ලබා දිය නොහැක. ඇතැම් අය හඳ ආදියට ගියත්, සමහරුන් ජලය මත ඇවිදින නමුත්, එය රාජයෝගාව නොවෙයි. ඔවුන්ට සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන බවට පරිවර්ථනය වීමට නොහැක. ඔබ අයත් වූයේ ආදි සනාතන දෙවි දේවතා ධර්මයට බවත්, දැන් ඔබ නැවත වරක් එය බවට පත්වන බවත්, ඔබට මෙහිදී වැටහෙයි. පරම පියා ඔබට පෙර චක්‍රයේද මෙය පහදා දුන් බව, ඔබට දැන් සිහි වෙයි. පියා පවසන්නේ විශ්වාසවන්ත බුද්ධි ඇති අය, ජය ගනී. කෙනෙකුට විශ්වාසය නොමැති නම්, ඔහු සවන් දීමට නොපැමිණෙයි. විශ්වාසවන්ත බුද්ධි තිබුණු පසුවත් ඇතැම් අය, සැක ඇති බුද්ධි තිබෙන අය බවට පත්වෙයි. බොහෝ ඉතා හොඳ මහාරතීන්ද සැකයන් ඇති කරගනී. මායාගේ ඉතාමත්ම කුඩා කුණාටුවක් නිසා ශරීර අවධානය ඇතිවෙයි. බාප් සහ දාදා ඒකාබද්ධවයි සිටින්නේ. ශිව බාබා ඔබට ඥානය ලබා දෙන අතර, ඉන්පසුව ඔහු ආපසු යනවාද, නැත්නම් කුමක් සිදුවනවාද කියා කවුද දන්නේ? ඔහු සෑම විටෙකම මෙහි සිටින්නේද නැත්නම් ඔහු ඉවත්ව යනවාද කියා, ඔබ බාබාගෙන් විමසිය යුතුද? ඔබට පියාගෙන් මෙම ප්‍රශ්නය ඇසිය නොහැක. පරමාත්ම පියා පවසන්නේ මා ඔබට අපවිත්‍ර බවින් පිවිතුරු වීමට මඟ පෙන්වනවා. මම ඇවිත් යනවා මට කිරීමට බොහෝ වැඩ තිබේ. මා දරුවන් වෙතට පැමිණෙන අතර, ඔවුන්ගේ මාර්ගයෙන් කාර්යයන්ද සිදු කරගන්නවා. මේ ගැන කිසිවෙකු තුළ සැක ඇති නොවිය යුතුයි. ඔබගේ වගකීම වන්නේ පරම පියා සිහි කිරීමයි. සැක ඇති වීමෙන් ඔබ ඇද වැටෙයි. මායා ඔබට තදින් පහර දෙයි. පියා පවසන්නේ ඔහුගේ බොහෝ උපත් වල අවසන් උපතේ අන්තිමේදී, මා මෙම කෙනා තුළට ඇතුලු වෙනවා. අපට මෙම ඥානය ලබා දෙන්නේ, සැබවින්ම පරමාත්ම පියා පමණක් බව, ඔය දරුවන් තුළ විශ්වාසය තිබේ. වෙනත් කිසිවෙකුට එය ලබා දිය නොහැක. ඒ වුවද, විශ්වාසය ඇති වූ පසුවත්, බොහෝ දෙනෙක් වැටෙන බව, පියා දන්නවා. ඔබ පිවිතුරු විය යුතුයි. එබැවින් පරම පියා පවසන්නේ නිරතුරුවම මා පමණක් සිහි කරන්න! වෙනත් කිසිම දේක සිර නොවන්න. ඔබ ඒ අන්දමින් කතා කරන විට, ඔබට ස්ථිර විශ්වාසය නොමැති බව, වටහාගත හැක. පළමුවෙන්ම, එය තුළින්, ඔබගේ පාපයන් දුරුව යන, එක් දෙය වටහාගන්න. නිෂ්ඵල දේවල් ගැන කතා කිරීමට අවශ්‍ය නැත. පරමාත්ම පියාගේ සිහිපත් කිරීම තුළින් ඔබගේ පාපයන් දුරු වෙයි. එබැවින් ඔබ වෙනත් දේවල පැටලෙන්නේ කුමටද? කෙනෙක් ප්‍රශ්න සහ පිළිතුරු මඟින් අවුලට පත් වන බව ඔබ දකින විට, ඔහුට කියන්න එම දේවල් අමතක කර, එක් පරම පියාව සිහිපත් කිරීමට උත්සාහ දරන්න. ඔබ සැක මතු කරගත් විට, ඔබ ඉගෙනීම නතර කරන අතර, එවිට කිසි යහපතක් සිදු නොවෙයි. ඔවුන්ගේ නාඩි පරීක්ෂා කිරීමෙන් පසුව පහදා දෙන්න. ඔවුන්ට සැකයන් තිබේ නම්, එක් කරුණක් මත පමණක් ඔවුන් තුළ ස්ථිර විශ්වාසයක් ඇති කරවන්න. ඔබ බොහෝ උපායශීලීව විස්තර කළ යුතුයි. බාබා පැමිණ, අපව පිවිතුරු කරනවා, යන විශ්වාසය ඔය දරුවන්ට පළමුවෙන්ම තිබිය යුතුයි. ඔබට මෙම සතුට තිබේ. ඔබ ඉගෙන ගන්නේ නැත්නම්, ඔබ අසමත් වෙයි. එවන් ජීවාත්මයක් එවිට සතුටින් සිටින්නේ කෙසේද? එකම අධ්‍යාපනයක් තිබෙන පාසැලේදී, සමහරු ඉගෙනගෙන සිය දහස් ගණන් උපයන අතර, වෙනත් අය රුපියල් පහක් හෝ දහයක් උපයයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය වන්නේ, සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන බවට පරිවර්ථනය වීමයි. රාජධානියක් ස්ථාපිත වෙනවා. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමට යනවා. දේවතාවන්ට විශාල රාජධානියක් ඇත. එහි උසස් තත්ත්වයක් හිමි කරගැනීම රඳා පවතින්නේ ඔබගේ ඉගෙනුම සහ ක්‍රියාකාරකම්

මතයි. ඔබගේ ක්‍රියාකාරකම් බොහෝ සේ යහපත් විය යුතුයි. බාබා තමන් ගැන මෙසේද කියයි මා තවමත් මගේ කර්මතීට් තත්ත්වයට පත්වී නැහැ. මාද අංගසම්පූර්ණ විය යුතුයි මා තවමත් එය වී නැත. ඥානය ඉතාමත්ම පහසුයි. පියා සිහිපත් කිරීමත් පහසුයි, නමුත් ඔබ අඩු තරමින් එයවත් කළ යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිම කරුණක් මත සැක උපදවා, ඉගෙනීම නතර නොකරන්න. පාරිශුද්ධත්වයට පත් වීම සඳහා, පළමුව, ඒකායන පියාව සිහිපත් කරන්න. වෙනත් කාරණා වල පැටලෙන්න එපා.
2. බාධක පැමිණෙන්නේ, ඔබගේ බැල්ම, ශරීරය මත පතිත වූ විටයි. එබැවින් සෑම විටෙකම නළල මධ්‍යය දෙස බලන්න. තමන් ජීවාත්ම බව සලකා, ජීවාත්ම වලට කතා කරන්න. ජීවාත්ම අවධානයට පත්වන්න. නිර්භය වී සේවය කරන්න.

**වරදානය:** ඔබ බලයේ ප්‍රතිමූර්තියක් වී, කලි යුගී දුර්වලතාවයන්ගේ කන්ද, ඔබගේ අධිෂ්ඨානගත සිතිවිලි වලින් විනාශ කර දමන්න.

ඔබ අධෛර්යමත් වූ විට, සංස්කාරයක හෝ අහිතකර සිදුවීමක බලපෑමට හසු වූ විට, පුද්ගලයෙකුට හෝ භෞතික පහසුකමකට ආකර්ෂණය වූ විට මෙම සියළුම දුර්වලතාවයන්ගේ කලි යුගී කන්දට, අධිෂ්ඨානගත සිතිවිලි වල අතැඟිල්ලක් ලබා දී, එය සෑම කලටම විනාශ කර දමන්න, එනම්, ජය ගන්න. 'ජයග්‍රහණය, ඔබගේ ගෙල වටා ඇති මාලයයි', මෙම අවධානයෙන්, ඔබ සෑම විටම බලයේ ප්‍රතිමූර්තියක් වෙයි. සෙනෙහසට ප්‍රතිඋපකාරය මෙයයි. ඔහුගේ මනෝ ස්ඵීතියේ කුලුණක් වීමෙන්, සකාර් බාබා මෙය ප්‍රායෝගිකව පෙන්වූ ආකාරයෙන්ම පියාව අනුගමනය කර, සියළු ගුණධර්මවල කුලුණක් වන්න.

**පාඨය:** පහසුකම් තිබෙන්නේ ඔබගේ සුඛ විහරණය හෝ පහසුව සඳහා නොව, සේවය සඳහාය.

***** ඕම ශාන්ති *****